# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

| | | |
|---|---|---|
| 4 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය : පැය 01 මිනිත්තු 30 |

නම ........................................................................................................................

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(01). පහත සඳහන් වගන්ති හරිනම් (✓) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

1. සිරිත් මල්දම හොඳ සිරිත් කියා දෙන කාව්‍ය ග්‍රන්ථයකි. (   )
2. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කරන ලද්දේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ ය. (   )
3. රාහුල පොඩි හාමුදුරුවෝ හැමදාම අවවාද අපේක්ෂාවෙන් කටයුතු කළහ. (   )
4. මහනුවර දළදා පෙරහැර වාර්ෂිකව පැවැත්වෙන්නේ ඇසළ මාසයේදී ය. (   )
5. අවශ්‍ය විට දී තම හැකියාවන් පෙන්වීම ජීවන පුරුද්දක් කර නොගත යුතුය. (   )
6. සුන්දර වදන් ඇති හෙයින් බුදුරාජාණන් වහන්සේ සුගත නම් වන සේක. (   )
7. නිරහංකාරව ජීවත්වීම කිසි කෙනෙකුට කළ නොහැකි දෙයකි. (   )
8. වැඩක නොයෙදීම තුළින් ඕනෑම කෙනෙකුගේ සිත නරක අතටම යොමු විය හැකිය. (   )
9. අස්සජි හාමුදුරුවන්ගෙන් ධර්මය අසා උපතිස්ස පරිබ්‍රාජකතුමා සෝවාන් බවට පත්වූහ. (   )
10. තමන් දන්නා දේ යහළුවන්ටත් කියාදීම පුරුද්දක් කර නොගත යුතුය. (   )

(ලකුණු 2×10=20)

(02). පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. නිහතමානී ගුණය නිසා කවුරුත් ප්‍රියකළ හිමි නමකි.
   1. නන්ද　　2. රාහුල　　3. චුල්ලපන්ථක
2. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව නිධන් කොට සාදවන ලද වෙහෙර වහන්සේ වන්නේ,
   1. මුතියංගන දාගැබ　　2. ථූපාරාම දාගැබ　　3. ජේතවනාරාම දාගැබ
3. “මහරජ, බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා දුටුවොත් උන්වහන්සේ දුටුවා හා සමානයි.” මෙසේ පැවසුවේ.
   1. මිහිඳු මහ රහතන් වහන්සේ　　2. සුමන සාමණේරයන් වහන්සේ　　3. අස්සජි හාමුදුරුවෝ
4. සිදුහත් කුමාරයාගේ සුළු මව වූයේ,
   1. යසෝදරා දේවිය　　2. මහමායා දේවිය　　3. මහා ප්‍රජාපතී දේවිය
5. නිරෝගීව දීර්ඝායු සම්පත් ලැබූ භික්ෂුව,
   1. නන්ද හාමුදුරුවෝ　　2. මහපන්ථක හාමුදුරුවෝ　　3. බක්කුල හාමුදුරුවෝ
6. විහාරස්ථානයේ දී අප මුලින් ම වැඳුම් පිදුම් කළ යුත්තේ,
   1. බුදු පිළිම වහන්සේට ය.　　2. බෝධීන් වහන්සේට ය.　　3. වෙහෙර වහන්සේට ය.
7. බෞද්ධ කොඩියේ ඇති වර්ණ ගණන,
   1. 4 කි.　　2. 5 කි.　　3. 6 කි.
8. සොළොස්මස්ථානවලින් එකකි.
   1. කැලණිය　　2. කළුතර බෝධිය　　3. වෙහෙරහේන
9. සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ,
   1. වෙසක් පෝය දිනක ය　　2. පොසොන් පෝය දිනක ය　　3. ඇසළ පෝය දිනක ය
10. සිදුහත් කුමරුගේ සිත තපස කෙරෙහි යොමු වීමට හේතු වූයේ,
    1. කුඩා අවධියේදී ම තම මව කළුරිය කළ නිසා ය.
    2. සතර පෙර නිමිති දැක සිත කළකිරී සිටි නිසා ය.
    3. රාජ මාලිගාවටම සීමා වී සිටි නිසා ය.

(ලකුණු 2×10=20)

(03). පහත දැක්වෙන වචනවලින් කියවෙන අදහස ලියන්න.

1. ධර්මය වදාළහ - ..........................................................................................
2. බුද්ධ වන්දනාව - ..........................................................................................
3. ධෝවනය කරනවා - ..........................................................................................
4. භීල දානය - ..........................................................................................
5. සැතපෙනවා - ..........................................................................................

(ලකුණු 10)

(04). පහත සඳහන් ප්‍රකාශයන් කවුරුන් විසින් කරන ලද්දක් දැයි සඳහන් කරන්න.

1. “රාහුල කැඩපත කුමකට ද?”

.......................................................................................................................................................

2. “රජතුමනි, බොහෝ කලෙකින් බුදුරජාණන් වහන්සේ දකින්ට ලැබුණේ නැහැ.”

.......................................................................................................................................................

3. “සිද්ධාර්ථ කුමාරයා බොහොම දක්ෂයි.”

.......................................................................................................................................................

4. මොනවා .......... මගේ පුතා පිඬුසිඟා වඩිනවා !

.......................................................................................................................................................

5. “අම්මේ අපි ලබන පෝයටත් අද වගේ ම පන්සල් යමු.”

.......................................................................................................................................................

(ලකුණු 15)

(05). පින්තූරයන්හි සඳහන් අවස්ථා නම් කරන්න.

1. ....................................................... 2. .......................................................

(ලකුණු 06)

(06). මෙම කවිය සම්පූර්ණ කරන්න.

සැනසුණු සිතකි මේ පිබිදුණු මුහුණක් ය
සන්සුන් බවකි මේ පින්බර ගමනක් ය
..............................................................................................................
..............................................................................................................

(ලකුණු 04)

(07). තෙරුවන් නම් කරන්න.

1. .......................................................................................................................................
2. .......................................................................................................................................
3. .......................................................................................................................................

(08). බෞද්ධ දරුවෙකු තුළ දැකිය හැකි ගුණාංග 03ක් ලියන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................

(09). සුද්ධෝදන මහ රජතුමා සිදුහත් කුමරා වෙනුවෙන් සැදූ මාලිගා තුන නම් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................

(10). දහම් පාසල් යාමෙන් අපට ලැබෙන ප්‍රයෝජන තුනක්,

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................

(11). සෑම කෙනෙකු විසින්ම සංවර කර ගත යුතු තුන්දොර වන්නේ,

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................

(ලකුණු 15)

(12). සතර පෙර නිමිති පිළිවෙළින් ලියන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

(ලකුණු 04)

(13). ථූපාරාම වෙහෙර වහන්සේ පිළිබඳව වගන්ති 03ක් ලියන්න.

1. ........................................................................................................................................
........................................................................................................................................
2. ........................................................................................................................................
........................................................................................................................................
3. ........................................................................................................................................
........................................................................................................................................

(ලකුණු 06)